# දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක පිරිමි සහ දුම්රිය ආරක්ෂක කාන්තා තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

**වැටුප් කේත අංකය : - RS-01-2016**

# දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක පිරිමි සහ දුම්රිය ආරක්ෂක කාන්තා තනතුරු සඳහා වන බඳවා ගැනීමේ පටිපාටිය

01. සම්බන්ධ වන ආයතන

1.1 දෙපාර්තමේන්තුව :ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව

යොමු අංකය:GMA/SOR/RS -01 දිනය:2019.02.12

1.2 අමාත්‍යාංශය :ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

යොමු අංකය :MT/03/H/දුඅග/නව බඳවා ගැනීමේ පටිපාටිය දිනය :2019.02.25

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම

යොමු අංකය :DMS/1142 දිනය :2014.05.29
DMS/1142/IV 2017.10.13

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය :

යොමුඅංකය :EST-2/07/REC/1293 දිනය : 2019.01.09

1.5 ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය:

යොමු අංකය :NSCC/02/43/SR-II දිනය :2018.11.30

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය:

යොමු අංකය :PSC/EST/04-01-43/01/2019 දිනය :2019.09.10

02. පත් කිරීම් බලධරයා :රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලය පවරන ලද දුම්රිය සාමාන්‍යාධිකාරී

03. සේවා ගණය පිළිබඳ විස්තර :

3.1 සේවා ගණය :පොලිස් සහ නියාමන සේවා

3.2 ශ්‍රේණි :අදාළ නොවේ.

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :

දුම්රිය දෙපාර්තමේන්තුවේ නිශ්චල, චංචල දේපළ , දුම්රිය මගීන් සහ දුම්රියෙන් ප්‍රවාහනය කරන සියළුම භාණ්ඩ වලට ආරක්ෂාව සැපයීම හා දුම්රිය දෙපාර්තමේන්තුව තුල නීතිය හා සාමය ආරක්ෂා කිරීම.

3.4 කාර්යයන් පැවරීම : ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර මෙම සේවා ගණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යයක් සේවයේ අවශ්‍යතාව මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොට ගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයෙකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

04. තනතුරෙහි / තනතුරුවල ස්වභාවය :ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)

05. වැටුප්:

5.1 වැටුප් කේත අංකය : RS 1 –2016

5.2 මාසික වැටුප් පරිමාණය :රු.29,540-7X300-27X370-41,630/-

5.3 තනතුරු නාමය,වැටුප් කේත අංකය හා අදාළ මාසික වැටුප් පියවර:

| අනුමත තනතුරු නාමය | වැටුප් කේත අංකය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය(රු.) |
|---|---|---|---|
| ආරක්ෂක | RS 1 –2016 | 01 | 29,540/- |

වැටුප් ගෙවීම හා අදාළ අනෙකුත් කරුණු රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක **03/2016** හි විධිවිධානයන්ට අනුකූල විය යුතුය.

06. සේවා ගණයට අයත් තනතුර / තනතුරු :

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| දුම්රිය ආරක්ෂක (පිරිමි) | III | 405 | • දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපල, කාර්ය මණ්ඩලය හා දුම්රිය මගීන් ආරක්ෂා කිරීම.<br>• දුම්රියෙන් ප්‍රවාහනය කරන භාණ්ඩ වලට ආරක්ෂාව සැපයීම.<br>• දෙපාර්තමේන්තුවේ සිදුවන වංචා, දූෂණ,සොරකම් පිළිබඳව අදාළ පරිදි දෙපාර්තමේන්තු මට්ටමේ මූලික විමර්ෂණ පැවැත්වීම.<br>• දුම්රිය කාර්ය මණ්ඩල වලට වැටුප් ගෙවන අවස්ථාවලදි හා මුදල් ප්‍රවාහනයේදී මුදල් වලට හා කාර්ය මණ්ඩලයට ආරක්ෂාව සැපයීම හා දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ අධිකාරී (දුම්රිය ආරක්ෂක) විසින් හෝ බලය පවරන ලද නිලධාරීන් විසින් වරින් වර පවරනු ලබන රාජකාරී |

| | | | |
|---|---|---|---|
| දුම්රිය ආරක්ෂක (කාන්තා) | III | 100 | • දුම්රිය කාන්තා මගීන් පරීක්ෂා කිරීම.<br>• දුම්රිය දෙපාර්තමේන්තුවේ දේපළ ආරක්ෂා කිරීම.<br>• දුම්රිය මගීන්ට ආරක්ෂාව සැපයීම.<br>• දුම්රිය මගින් ප්‍රවාහන කරන ජනතාවගේ භාණ්ඩ වලට ආරක්ෂාව සැපයීම.<br>• දුම්රිය දෙපාර්තමේන්තුවේ සිදුවන සොරකම්,වංචා,දූෂණ පිළිබඳව දෙපාර්තමේන්තු මට්ටමින් මූලික විමර්ශන පැවැත්වීම.<br>• දුම්රිය කාර්ය මණ්ඩල වලට වැටුප් ගෙවන අවස්ථාවලදී හා මුදල් ප්‍රවාහනයේදී මුදල් වලට හා කාර්ය මණ්ඩලයට ආරක්ෂාව සැපයීම හා දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ අධිකාරී (දුම්රිය ආරක්ෂක) විසින් හෝ බලය පවරන ලද නිලධාරීන් විසින් වරින් වර පවරනු ලබන රාජකාරී. |

6.2 ඒකාබද්ධ නිලධර සංඛ්‍යාව :

දුම්රිය ආරක්ෂක (පිරිමි) 405

දුම්රිය ආරක්ෂක (කාන්තා) 100

## 07. බඳවා ගැනීමේ ක්‍රමය :

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන්:

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | 100% |
| සීමිත | අදාළ නොවේ |
| කුසලතා | අදාළ නොවේ |

7.2 විවෘත බඳවා ගැනීම :

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : III ශ්‍රේණිය

7.2.2 සුදුසුකම් :

7.2.2.1 අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි හා ගණිතය ඇතුළුව විෂයන් හයක් (06) සම්මාන සාමාර්ථ දෙකක් (02) සහිතව සමත් වී තිබීම.

7.2.2.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.2.2.3 පළපුරුද්ද : අදාළ නොවේ.

7.2.2.4 කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

7.2.2.5 වෙනත් :

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය

iii. උස :- පිරිමි අයදුම්කරුවන් සඳහා අඩි 05 යි අඟල් 06 ක් තිබිය යුතුය. (5' 6")(පාවහන් නොමැතිව)
කාන්තා අයදුම්කරුවන් සඳහා අඩි 05 යි අඟල් 02 ක් තිබිය යුතුය.(පාවහන් නොමැතිව)

iv. පපුව අඟල් 32 ක් තිබිය යුතුය.(පිරිමි අයදුම්කරුවන් සඳහා)

v. ඇස් පෙනීම :- ඇස් කණ්නාඩි නොමැතිව "ඒ" 2 දෘෂ්ඨි ප්‍රමාණය තිබිය යුතුය.(මෙය එල්.බී.29 අක්ෂි දෘෂ්ඨි පරීක්ෂණයෙන් සමත්වීමට යටත්වය.)

vi. සියළුම අයදුම්කරුවන් අවිවාහක විය යුතුය.

vii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය 7.2.2 සිට 7.2.3 දක්වා වන සියළුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

7.2.3 වයස :

7.2.3.1 අවම සීමාව: අවු.18 ට නොඅඩු

7.2.3.2 උපරිම සීමාව: අවු. 28ට නොවැඩි

7.2.4 බඳවා ගැනීමේ ක්‍රමය :

ප්‍රථමයෙන් මූලික පරීක්ෂණයක් පවත්වා මූලික පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් ලිඛිත විභාගයට කැඳවනු ලබන අතර ලිඛිත විභාගයේ සෑම විෂයකටම 50% ක් හෝ ඊට වඩා ලකුණු ගන්නා අයදුම්කරුවන් / අයදුම්කාරියන් පමණක් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව ලිඛිත විභාගයෙන් ලබා ගන්නා ලකුණු සංඛ්‍යාව සමඟ එකතු කොට අයදුම්කරු / අයදුම්කාරියන් ලබා ගත් මුළු ලකුණු සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසාන දිනට පවතින පුරප්පාඩු සංඛ්‍යාව සඳහා ලබාගත් මුළු ලකුණු සංඛ්‍යාවේ කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

7.2.4.1 ලිඛිත විභාගය :

| විෂයන් | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | 100 | 50 |
| භාෂා හැකියාව | 100 | 50 |

(ඇමුණුම 01 බලන්න)

7.2.4.1.1 පවත්වන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

**7.2.4.2** වෘත්තීය පරීක්ෂණය : අදාල නොවේ.

7.2.4.2.1 පවත්වන බලධරයා :අදාළ නොවේ.

**7.2.4.3** සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :අදාල නොවේ.

**7.2.4.4.**යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය:යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන අවස්ථාවේදී ම සුදුසුකම් පරීක්ෂා කිරීමද සිදු කෙරේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අදාළ නොවේ. |
| 2. නායකත්ව හා වෙනත් ප්‍රජා සේවාවන් | 20 | |
| 3. ක්‍රීඩා කුසලතා | 30 | |
| 4. භාෂා දැනුම හා තොරතුරු තාක්ෂණය පිළිබඳ දැනුම | 25 | |
| 5. සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වනු ලබන කුසලතාවය | 05 | |
| මුළු ලකුණු | 100 | |

සටහන :

ඉහත සඳහන් වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති ලකුණු ප්‍රමාණයන් ඇතුලත යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම පත් කිරීමේ බලධරයා විසින් සිදු කරනු ලබන අතර එම විස්තරාත්මක ලකුණු දීමේ පරිපාටිය අයදුම්පත් කැඳවීමේ නිවේදනය මඟින් ප්‍රසිද්ධ කළ යුතුය.

7.2.4.4.1 යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය මණ්ඩලය පත් කරන බලධරයා: දුම්රිය සාමාන්‍යාධිකාරී

**7.2.4.5. මූලික පරීක්ෂණ:** අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයදුම්කරුවන් / අයදුම්කාරියන් අතුරින් මූලික සුදුසුකම් සපුරා ඇති අයදුම්කරු/අයදුම්කාරිය පමණක් මූලික පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එම පරීක්ෂණයේදී ඉහත 7.2.2 සිට 7.3.2 දක්වා වූ සුදුසුකම් පරීක්ෂා කර බලනු ලැබේ.

7.2.4.5.1 : ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය: දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පත්කරනු ලබන මණ්ඩලයක් මඟින් අයදුම්කරුවන්/ අයදුම්කාරියන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණයට භාජනය කරනු ලැබේ.

7.2.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය :රජයේ ගැසට් පත්‍රයේ පලකිරීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම පළකිරීම සහ වෙබ් අඩවියේ දැන්වීම් පළ කිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

7.3 සීමිත බඳවා ගැනීම :අදාළ නොවේ

7.4 කුසලතා පදනම මත බඳවා ගැනීම : අදාළ නොවේ

## 08. කාර්යක්ෂමතා කඩඉම :

8.1

| කුමන කාර්යක්ෂමතා කඩඉමද යන වග | කාර්යක්ෂමතා කඩඉම සමත්විය යුත්තේ කොපමණ වසර ගණනකට පෙරද | කාර්යක්ෂමතා කඩඉමේ ස්වභාවය ලිඛිත පරීක්ෂණය / වෘත්තීය පරීක්ෂණය /සහතික පාඨමාලාව/වෙනත් |
|---|---|---|
| 1 වන කාර්යක්ෂමතා කඩඉම | දුම්රිය ආරක්ෂක (පිරිමි) හා දුම්රිය ආරක්ෂක (කාන්තා) තනතුරටබඳවාගෙන වසර 03 ක් ඉක්මවීමට පෙර | ලිඛිත පරීක්ෂණය (ඇමුණුම 02) |

8.2 කාර්යක්ෂමතා කඩඉම් පවත්වනු ලබන්නේ කොපමණ කාලයකට වරක්ද : වසරකට දෙවරක්

8.3 කාර්යක්ෂමතා කඩඉම්වලට අදාළ පරීක්ෂණ පවත්වනු ලබන බලධරයින් කවුරුන්ද ?

1 වන කාර්යක්ෂමතා කඩඉම- දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

## 09. භාෂා ප්‍රවීණතාව :

9.1

| භාෂාව | ලබා ගත යුතු ප්‍රවීණතාව |
|---|---|
| 01.රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුල ලබාගත යුතුය. |
| 02. අනෙක් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක1/2014හා ඊට අනුෂාංගික චක්‍රලේඛ විධිවිධාන අනුව අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාව ලබාගතයුතුය |

## 10. ශ්‍රේණි උසස් කිරීම් : අදාළ නොවේ.

## 11. තනතුරුවලට පත් කිරීම:අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන පොදු කොන්දේසිවලට පරිබාහිර වන්නාවූ කොන්දේසි; අදාල නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණවලට පරිබාහිර වන්නා වූ අර්ථ නිරූපණ:

"සක්‍රීය සේවා කාලය යනු වැටුප් රහිත නිවාඩු කාලයක් ඇතුළත් නොවන, එහෙත් අමාත්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්තියක් ලෙස සක්‍රීය සේවා කාලයක් ලෙස සැලකිය යුතුයැයි විශේෂිතව සඳහන් කරනු ලැබ ඇති වැටුප් රහිත නිවාඩු කාලයන් ද ඇතුළත් , නිලධාරියෙකු ස්වකීය තනතුරට අදාළ වැටුප් ලබමින් සිටි සේවා කාලය වේ ."

14. ශ්‍රේණි ක්‍රමයට අන්තර්ග්‍රහණය :

මෙම බඳවා ගැනීම් පරිපාටිය ක්‍රියාත්මක වන දිනට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006(iv) අනුව RS-01-2006 A වැටුප් පරිමාණය යටතේ වැටුප් ලබන නිලධාරීන් සියළුදෙනාම ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 04 වන වගන්තියේ විධිවිධාන වලට යටත්ව පහත සඳහන් පරිදි අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

කෙසේ වුවද අන්තර්ග්‍රහණය හේතුවෙන් අදාළ තැනැත්තාගේ වැටුප් වර්ධක දිනයෙහි වෙනසක් සිදු නොවිය යුතු අතර එම දිනය අන්තර්ග්‍රහණයට පෙර පැවති වැටුප් වර්ධක දිනය වශයෙන් නොවෙනස්ව ක්‍රියාත්මක විය යුතුය. එසේම වැටුප් පරිවර්තනයේදී අදාළ තැනැත්තා අවසන් වරට ලබමින් සිටි වැටුප් පියවර නව වැටුප් පියවරට අනුරූපී වීම මත ආයතන සංග්‍රහයේ VII පරිච්ඡේදයේ 4.4 වගන්තිය අනුව ඊළඟ ඉහළ වැටුප් පියවරේ තැබීමද සිදු නොකළ යුතුය.අන්තර්ග්‍රහණය හේතු කොටගෙන නිලධාරියාට හිමිව පැවති ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨතාවයට හානියක් සිදු නොවේ.

දුම්රිය ආරක්ෂක (පිරිමි)/ දුම්රිය ආරක්ෂක (කාන්තා) තනතුරේ සේවයේ නියුතු සියළුම නිලධරයන් මෙම බඳවා ගැනීම් පරිපාටියේ සඳහන් දුම්රිය ආරක්ෂක (පිරිමි) / දුම්රිය ආරක්ෂක (කාන්තා) තනතුරට අන්තර්ග්‍රහණය කරනු ලැබේ.

15. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්යය පටිපාටික රීති වල දැක්වෙන කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධි විධාන අදාළ වේ.

16. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධාන සලසා නොමැති යම් කරුණක් වේනොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍යසේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

17. අන්තර්කාලීන විධිවිධාන - අදාළනොවේ.

සකස් කළේ: ..................................

නම : ජේ.යූ.එස්. ගුණවර්ධන

තනතුර : පරිපාලන නිලධාරී (පත්වීම්) ආවරණ
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
මරදාන, කොළඹ 10.

දිනය : ..................................

පරීක්ෂා කළේ: ..................................
(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරියා)

නම : ..................................

තනතුර : .................................. පී. ගමගේ
අතිරේක සාමාන්‍යාධිකාරී (පරිපාලන)
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
කොළඹ 10.

දිනය : ..................................

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..............................

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : ..............................

තනතුර : ඩබ්. ඒ. ඩී. ප්‍රනාන්දු
දුම්රිය සාමාන්‍යාධිකාරි
දුම්රිය සාමාන්‍යාධිකාරි කාර්යාලය
කොළඹ 10.

දිනය : 31/10/2019 නිල මුද්‍රාව :

---

යොමු අංකය : MT/03/[illegible]

2019.09.10 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක පිරිමි හා දුම්රිය ආරක්ෂක කාන්තා තනතුරු සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය සහතික කිරීම සඳහා නිර්දේශ කරමි.

අත්සන : ..............................

නම : ..............................

ලේකම්

ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය

එල්. පී. ජයම්පති
ලේකම්
ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යාංශය
7 වන මහල, සෙත්සිරිපාය, (අදියර II)
බත්තරමුල්ල.

දිනය : 2019/11/11 නිල මුද්‍රාව : ..............................

---

යොමු අංකය : PSC/SCT/04-01-43/01/2019

දුම්රිය දෙපාර්තමේන්තුව හි දු.ආ.සේ. දු.ආ. පිරිමි හා දු.ආ. කාන්තා සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය 2019.09.10 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදී.

අත්සන : ..............................

නම : එම්. ඒ. බී. දයා සෙනරත්

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2020/01/09 නිල මුද්‍රාව : එම්. ඒ. බී. දයා සෙනරත්
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
නො. 1200/9, රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ඇමුණුම 01

01. විභාගයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක පිරිමි හා දුම්රිය ආරක්ෂක කාන්තා තනතුරු වලට බඳවා ගැනීම සඳහා වන ලිඛිත විභාගය

02. විභාගය පිළිබඳ විස්තර :

| ප්‍රශ්න පත්‍රය / විෂය ක්ෂේත්‍රය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 50 |
| භාෂා හැකියාව | පැය 02 | 100 | 50 |

03. විභාගය පවත්වන ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්

04. විභාගය පවත්වනු ලබන්නේ කොපමණ වාර සීමාවකට වරක්ද යන වග : පුරප්පාඩු ඇතිවන්නා වූ අවස්ථාවන්හිදී

05. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| බුද්ධි පරීක්ෂණය | අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනීම හා බුද්ධිය පිළිබඳව මැනීමක් කිරීම අරමුණු කොට ගෙන ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම හා පරිසරය ආශ්‍රිත ප්‍රශ්න ඇතුලත් ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |
| භාෂා හැකියාව | භාෂාව හැසිරවීමේදී ලබාගතහ යුතු ව්‍යාකරණ, අර්ථ නිරූපන, සාරාංශ කිරීම හා භාෂාව පිළිබඳ අවබෝධය පිළිබඳ මැනීමක් කිරීම අරමුණු කොට ගෙන සකසන ලද ව්‍යුහගත හා රචනා මාදිලියේ ප්‍රශ්න පත්‍රයකි. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ........................
(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එම්. ජේ. ඩී. ප්‍රනාන්දු

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී

නිල මුද්‍රාව: දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය, කොළඹ 10.

දිනය : 31/10/2019

ඇමුණුම 02

01. පරීක්ෂණයේ නම : දුම්රිය දෙපාර්තමේන්තුවේ පොලිස් සහ නියාමන සේවා ගණයේ දුම්රිය ආරක්ෂක සේවයේ දුම්රිය ආරක්ෂක පිරිමි හා දුම්රිය ආරක්ෂක කාන්තා තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය

02. පරීක්ෂණය පිළිබඳ විස්තර ;මෙම කාර්යක්ෂමතා කඩඉම ලිඛිත පරීක්ෂණයකි.

ලකුණු ලබාදෙන නිර්ණායකයන් පහත පරිදි වේ.

| ප්‍රශ්න පත්‍රයේ ස්වභාවය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග අණපනත් හා පාලන නියෝග | පැය 02 | 100 | 40 |
| වාණිජ පරිශිෂ්ඨය | පැය 02 | 100 | 40 |
| දුම්රිය ආඥා පනත හා උසාවි ක්‍රියා පරිපාටි | පැය 02 | 100 | 40 |

03. පවත්වනු ලබන බලධරයා : දුම්රිය සාමාන්‍යාධිකාරී හෝ ඔහු විසින් අනුමත කරනු ලබන ආයතනයක් මඟින්.

04. පරීක්ෂණය පවත්වනු ලබන්නේ කොපමණ කාල සීමාවකට වරක්ද යන වග :වසරකට දෙවරක්

05. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| දුම්රිය ආරක්ෂක හමුදා ස්ථාවර නියෝග අණපනත් හා පාලන නියෝග | සියළුම පරිච්ඡේද අදාල වන බැවින් ඒවා පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම. |
| වාණිජ පරිශිෂ්ඨය | I,II,V දක්වා වන පරිච්ඡේද යටතේ ඇතුළත් කරුණු පිළිබද දැනුම පරීක්ෂා කිරීම. |
| දුම්රිය ආඥා පනත හා උසාවි ක්‍රියා පරිපාටි | වගන්ති අංක 01,02,07,08,09,10,11,12,13,14,23,24,26,29,30,31 හා 34 දක්වා වන වගන්ති වල ඇතුලත් කරුණු පිළිබඳව දැනුම පරීක්ෂා කිරීම. |

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........

(දෙපාර්තමේන්තු ප්‍රධානියා)

නම : එම්. ජේ. ඩී. ප්‍රනාන්දු

තනතුර : දුම්රිය සාමාන්‍යාධිකාරී

දිනය : 21/11/2019

නිල මුද්‍රාව: දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය කොළඹ 10.